# දිළිඳු ජනතාව බලගැන්වීමේ අන්තර් ජාතික කොමිසමෙන් මිලින්දට ඇරියුම්



ලොව පුරා වෙසෙන කෝටි සංඛ්‍යාත දිළිඳු ජනතාව නෛතිකව බල ගැන්වීම සඳහා අන්තර් ජාතික කොමිසමක් පත් කර ඇති අතර එහි සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා ඇරියුම් ලැබ සිටී.

ලබන සැප්තැම්බර් මාසයේ නිව්යෝර්ක්හිදී පළමු වරට රැස්වීමට නියමිත මෙම කොමිසමට ලොව කීර්තිමත් හා ක්‍රියාශීලී නායකයෝ විසි දෙදෙනකු නම් කර ඇති අතර සම සභාපතිවරුන් ලෙස අමෙරිකා එක්සත් ජනපදයේ හිටපු රාජ්‍ය ලේකම් මැඩ්ලින් ඕල්බ්‍රයිට් සහ වත්මන් පේරු ජනාධිපති හෙරන්ඩෝ ද සෝටෝ යන මහත්වරු පත්ව ඇත.

නෝර්වේ රජය සහ දුප්පත්කම තුරන් කිරීම සඳහා උනන්දුවක් දක්වන ආයතන රැසක් එකතු වී නීතිමය වශයෙන් ඒ සඳහා ඇති බාධාවන් සොයා බලා ජාත්‍යන්තරව උපදෙස් හා යෝජනා නිකුත් කිරීමේ අරමුණින් මෙම කොමිසම පිහිටුවා තිබේ.

පසුගිය වසර ගණනාවක කාලයක් පුරා දුප්පත්කම තුරන් කිරීම සඳහා ගෙනයන ව්‍යායාම ශක්තිමත් නොවීමට බලපෑ කාරණාවන් සම්බන්ධව අධ්‍යයනය කිරීමෙන් පසු සෑම රටකම නිල ආර්ථිකයට හසු නොවන මූල්‍ය අංශ රැසක ක්‍රියාකාරකම් ඇති බව පෙනී ගොස් ඇති අතර ඒවා හඳුනාගෙන නිල ආර්ථිකයට එම අංශ එකතු කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනාගැනීමට මෙම කොමිසම කටයුතු කරනු ඇත. මේ සඳහා ස්වාධීන ලේකම් ජනරාල් කාර්යාලයක් ළඟදීම ස්ථාපිත කරනු ඇති අතර එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් සහශ්‍රකයේ සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මෙය එක් අවස්ථාවක් වශයෙන් නම් කර තිබේ.

මෙම දිළිඳු ජනතාව නෛතිකව බල ගැන්වීම සඳහා වූ අන්තර්ජාතික කොමිසම සිය වාර්තාව 2007 අවසානයට පෙර ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර සෑම කමිටු සාමාජිකයකුම වසරකට දෙවතාවක් බැගින්

රැස්වෙමින් තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමෙන්ද සහ තමන්ගේ කලාපයේ ඒ සඳහා නියාමක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින්ද දායක විය යුතුව ඇත.